# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,979 - 2016 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2016.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1414 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1432 |


*සැ. යු.-* අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනත් කෙටුම්පත 2016 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අගෝස්තු මස 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අගෝස්තු මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 ජූනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1411- B 81085 — 5,403 (2016/08)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙරතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම්කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 සැප්තැම්බර් මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගෝනපීනුවල | ගාල්ල දිස්ත්‍රික්කයේ ගෝනපීනුවල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

08-68

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම්කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 සැප්තැම්බර් මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | වැලිගම | වැලිගම් කෝරළය කොහොණුගමුව ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |

08-66

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම්කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 සැප්තැම්බර් මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | මල්ලවපිටිය | කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිල්ලි හත්පත්තුව කොට්ඨාසයේ මල්ලවපිටිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |

08-67

---

## ක්‍රීඩා අමාත්‍යාංශය

## ක්‍රීඩා වෛද්‍ය ආයතනය

ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධ ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ පවතින වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවා ඛණ්ඩය යටතේ වන භෞතචිකිත්සක / ඖෂධවේදී / වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය - සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පුරප්පාඩු අනුව බඳවා ගනු ලැබේ.

2. වැටුප් පරිමාණය - MT6 2016 - රු. 32080 - 10x445 - 11x660 - 10x730 - 10x750 රු.58,590 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට අනුව)

3. බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය

4. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

4.1. භෞත චිකිත්සක තනතුර (i) සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යෙන් ඉංග්‍රීසි භාෂාව සමත්වීම;

සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතරෙන් විෂයයන් 2ක් එකවර සමත්වීම;

සහ

(iii) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන වසර දෙකක පූර්ණකාලීන භෞතචිකිත්සක ඩිප්ලෝමා පාඨමාලාව හදුරා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ භෞතචිකිත්සකයකු ලෙස ලියාපදිංචි වී සිටීම;

හෝ

(iv) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ භෞත චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම;

සහ

(v) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ භෞතික චිකිත්සකයකු ලෙස ලියාපදිංචි වී සිටීම.

පුරප්පාඩු සංඛ්‍යාව 02

4.2. ඖෂධවේදී තනතුර

(i) සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත්වීම;

සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතරෙන් විෂයයන් 2ක් එකවර සමත්වීම;

සහ

(iii) වෛද්‍ය විද්‍යාල සභාව මඟින් මෙහෙයවනු ලබන ඖෂධවේදී දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ඖෂධවේදීයකු ලෙස ලියාපදිංචි වී සිටීම;

හෝ

(iv) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ ඖෂධවේදී/විද්‍යාවේදී (ඖෂධවේදී) විශේෂ උපාධියක් ලබා තිබීම.

සහ

(v) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ඖෂධවේදියකු ලෙස ලියාපදිංචි වී සිටීම.

පුරප්පාඩු සංඛ්‍යාව 01

4.3. වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ තනතුර

(i) සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යෙන් ඉංග්‍රීසි භාෂාව සමත්වීම;

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතරෙන් විෂයයන් 2ක් එකවර සමත්වීම;

*සහ*

(iii) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම;

*සහ*

(iv) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥයකු ලෙස ලියාපදිංචි වී සිටීම;

*හෝ*

(v) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ තනතුරට අදාල උපාධියක් ලබා තිබීම;

*සහ*

(vi) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥයකු ලෙස ලියාපදිංචි වී සිටීම.

පුරප්පාඩු සංඛ්‍යාව 01

5. *පළපුරුද්ද*

5.1. භෞත චිකිත්සක තනතුර - අවම වශයෙන් භෞතචිකිත්සකයකු ලෙස අවුරුද්දක සේවා පළපුරුද්ද (ක්‍රීඩා භෞතික චිකිත්සකවරයෙකු ලෙස රාජකාරි ඉටුකර තිබීම අමතර සුදුසුකමක් වේ.)

5.2. ඖෂධවේදී තනතුර - අවම වශයෙන් ඖෂධවේදියකු ලෙස අවුරුද්දක සේවා පළපුරුද්ද.

5.3. වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ තනතුර - අවම වශයෙන් වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥයෙකු ලෙස අවුරුද්දක සේවා පළපුරුද්ද.

6. වයස් සීමාව - ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

7. තනතුරුවල ස්වභාවය - ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

8. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා බලපානු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාල නොවේ |
| 2. භාෂා ප්‍රවීණතා | 20 | |
| 3. පරිගණක සාක්ෂරතාවය | 20 | |
| 4. අතිරේක වෘත්තීය පළපුරුද්ද | 35 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

9. කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

10. වෙනත් කරුණු :

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් සඳහා පමණි.

(ii) අදල උපාධිය හෝ ඩිප්ලෝමාව බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පෙර දිනයක් විය යුතු ය.

(iii) අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් දිනට අයදුම්කරුවන් විසින් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(iv) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

11. අයදුම් කළ යුතු ක්‍රමය :

(i) A4 ප්‍රමාණයේ කඩදසි භාවිතා කර මේ සමග ඇති ආකෘති පත්‍රයට අනුව (අංක 01 සිට 11 දක්වා පළමු පිටුවේ ද, 12 සිට 14 දක්වා දෙවන පිටුවේ ද වන සේ) අයදුම්පත සකස් කරගත යුතු ය.

(ii) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු / සාමදන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතීඥවරයෙකු හෝ ත්‍රිවිධ හමුදවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.3,34,452 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

(iii) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත අඟල් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයකට බහා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ ''භෞත චිකිත්සක / ඖෂධවේදී සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ තනතුරට බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කර 2016.08.31 දින හෝ එදිනට පෙර ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ආචාර්ය ඩී. එම්. ආර්. බී. දිසානායක.,
ලේකම්,
ක්‍රීඩා අමාත්‍යාංශය.

2016 ජූලි මස 18 වැනි දින,
ක්‍රීඩා අමාත්‍යාංශය,
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

**ක්‍රීඩා අමාත්‍යාංශය**

ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ පවතින භෞතචිකිත්සක / ඖෂධවේදී / වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත

ඉල්ලුම්කරන තනතුර :————.

01. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————. (මයා/මිය/මෙනවිය)
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (උදා:- A.B.C. SILVA)

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(iii) සම්පූර්ණ නම :————.
(සිංහලෙන් / දෙමළෙන්)

02. තැපැල් ලිපිනය : (සිංහලෙන් / දෙමළෙන්) ඉංග්‍රීසියෙන්

| (සිංහලෙන් / දෙමළෙන්) | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ................................. | ................................. |
| ................................. | ................................. |
| ................................. | ................................. |
| ................................. | ................................. |
| ................................. | ................................. |

03. ස්ථිර ලිපිනය : (සිංහලෙන් / දෙමළෙන්) ඉංග්‍රීසියෙන්

| (සිංහලෙන් / දෙමළෙන්) | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ................................. | ................................. |
| ................................. | ................................. |
| ................................. | ................................. |
| ................................. | ................................. |
| ................................. | ................................. |

04. දුරකථන අංක : ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐ ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐

05. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

06. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

07. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

08. 2016.08.31 වැනි දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

09. විවාහක/අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

10. ඔබ කවරදක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු වී තිබේද ?

11. ඔව් ☐ නැත ☐ (අදල කොටුවේ ✓ ලකුණ යොදන්න)

පිළිතුර "ඔව්" නම් විස්තර සපයන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

13. *අයදුම්කරුගේ සහතිකය* :

(*අ*) මා විසින් මෙම නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(*ආ*) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන..........................මයා / මිය/ මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඔහු/ඇය.....................දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

15. ඉල්ලුම්කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න)

i. ඉහත අයදුම්කරු / අයදුම්කාරිය වන .....................මහතා/ මහත්මිය/ මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ................. තනතුර දරන බව මින් සහතික කරමි.

ii. ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, ඔහු/ ඇය තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ ඇය දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

08-58/1

## ක්‍රීඩා අමාත්‍යාංශය

### ක්‍රීඩා වෛද්‍ය ආයතනය

ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධ ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ පවතින පෝෂණවේදී තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *බඳවා ගන්නා ශ්‍රේණිය* - II ශ්‍රේණිය

2. *අධ්‍යාපන සුදුසුකම්*

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව පළමුවන පන්තියේ හෝ දෙවැනි පන්තියේ විශේෂ උපාධියක් ලබා තිබීම;

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විෂයයක් ලෙස විද්‍යාවේ දී සාමාන්‍ය උපාධිය පළවෙනි පන්තියේ හෝ දෙවැනි පන්තියේ සාමාර්ථයක් සහිතව ලබා තිබීම;

සහ

(iii) ආහාර පෝෂණවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඉන් ඉහළ පාඨමාලාවක් හදරා තිබීම,

(iv) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම විද්‍යාව විශේෂ (ආහාර තාක්ෂණය හා පෝෂණය) උපාධිය පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සහිතව ලබාතිබීම;

හෝ

(v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පෝෂණවේදය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම;

හෝ

(vi) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ආහාර විද්‍යාව හා තාක්ෂණ විද්‍යාවේදී උපාධියක් හෝ ආහාර තාක්ෂණ ව්‍යවහාරික විද්‍යාවේදී උපාධියක් හෝ ආහාර නිෂ්පාදන හා තාක්ෂණ කළමණාකරන (විශේෂ) විද්‍යාවේ දී උපාධියක් හෝ ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳව (විශේෂ) විද්‍යාවේදී උපාධියක් හෝ ලබාතිබීම.

3. *වෘත්තීය සුදුසුකම්* - වෛද්‍ය සභාවේ පෝෂණවේදියෙකු ලෙස ලියාපදිංචි වීම.

4. *වැටුප් පරිමාණය* - MN5 - 2016 - 34,605 - 10x660 - 11x775 - 15x930 - රු. 63,460 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/ 2016 ට අනුව)

5. *වයස් සීමාව* - ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය* - ලිඛිත විභාගයෙන්

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| පොදු ප්‍රශ්න පත්‍රය | 100 | 40% |

පුරප්පාඩු සංඛ්‍යාව - 01

7. *තනතුරේ ස්වභාවය* - ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

8. *කායික සුදුසුකම්* - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

9. *වෙනත් කරුණු* :

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ අයදුම්පත් ඉදිරිපත්කර ඇති අපේක්ෂකයින් සඳහා පමණි.

(ii) අදාළ උපාධිය හෝ ඩිප්ලෝමාව බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පෙර දිනයක් විය යුතු ය.

(iii) අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් දිනට අයදුම්කරුවන් විසින් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(iv) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

10. *අයදුම් කළ යුතු ක්‍රමය* :

I. A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතාකර මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව (අංක 01 සිට 11 දක්වා පළමු පිටුවේ ද, 12 සිට 14 දක්වා දෙවන පිටුවේ ද වන සේ) අයදුම්පත සකස්කරගත යුතු ය.

II. අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 3,34,452/- කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

III. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත අඟල් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයකට බහා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ "පෝෂණවේදී තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කර 2016. 08.31 වැනි දින හෝ එදිනට පෙර ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ආචාර්ය ඩී. එම්. ආර්. බී. දිසානායක,
ලේකම්,
ක්‍රීඩා අමාත්‍යාංශය.

2016 ජූලි මස 18 වැනි දින
ක්‍රීඩා අමාත්‍යාංශය,
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

**ක්‍රීඩා අමාත්‍යාංශය**

***ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ පවතින පෝෂණවේදී තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත***

ඉල්ලුම්කරන තනතුර :————.

01. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————. මයා/මිය/මෙනවිය
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (උදා:- A.B.C. SILVA)

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(iii) සම්පූර්ණ නම :————.
(සිංහලෙන් / දෙමළෙන්)

02. තැපැල් ලිපිනය : සිංහලෙන් / දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන් / දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ................................ | ................................ |
| ................................ | ................................ |
| ................................ | ................................ |
| ................................ | ................................ |
| ................................ | ................................ |

03. ස්ථිර ලිපිනය : සිංහලෙන් / දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන් / දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ................................ | ................................ |
| ................................ | ................................ |
| ................................ | ................................ |
| ................................ | ................................ |
| ................................ | ................................ |

04. දුරකථන අංක : ජංගම [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ] ස්ථාවර [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

05. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී [ ] පුරුෂ [ ] (අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

06. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

07. උපන් දිනය : වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

08. 2016.08.31 දිනට වයස : අවුරුදු :————., මාස :————., දින :————.

09. විවාහක/අවිවාහක බව : විවාහක [ ] අවිවාහක [ ] (අදල කොටුවේ ✓ ලකුණ යොදන්න)

10. ඔබ කවරදක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු වී තිබේද ?

11. ඔව් [ ] නැත [ ] (අදල කොටුවේ ✓ ලකුණ යොදන්න)

පිළිතුර "ඔව්" නම් විස්තර සපයන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මා විසින් මෙම නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බවද මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන..........................මයා / මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය.....................දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

15. ඉල්ලුම්කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදල නොවන වචන කපා හරින්න)

(i) ඉහත අයදුම්කරු / අයදුම්කාරිය වන ....................මහතා/ මහත්මිය/ මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ................. තනතුර දරන බව මින් සහතික කරමි.

(ii) ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, ඔහු/ ඇය තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ ඇය දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

08-58/2

## ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව

බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම - 2016
විවෘත අංශය

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති බන්ධනාගාර නියාමක හා කාන්තා නියාමක තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/ පුරුෂ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *පුරප්පාඩු සංඛ්‍යාව සහ පුරප්පාඩු පිරවීම* :-

2.1 පුරප්පාඩු වී ඇති බන්ධනාගාර නියාමක (පිරිමි) හා (කාන්තා) තනතුරු ගණන තුන්සිය පනහක් (350) ක් වේ. මෙම පුරප්පාඩු වලින් සියයට අනූපහ (95%)ක් විවෘත අංශයෙන් ද, සියයට පහ (5%) ක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් ද පුරවනු ලැබේ.

2.2 කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

03. *තනතුරෙහි කාර්ය භාරය* :

බන්ධනාගාර ආයතනයන්හි පරිපාලනයට සහාය වීම සහ බන්ධනාගාරගත නේවාසිකයන්ගේ ආරක්ෂාව සැලසීම සහ ඔවුන් ආරක්ෂණය කිරීමට සහාය වීම.

04. *වැටුප් ක්‍රමය* :-

රු.29,540 - 300 x 7 - 370 x 27 - රු. 41,630 (RS 1 2016) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016)

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මාසිකව රාජකාරි කිරීම අනුව විශේෂ දීමනා උපයා ගත හැක.

05. *අවශ්‍ය සුදුසුකම්* :-

(*අ*) *වයස් සීමාව* :
*ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු දහ අට (18) ට නොඅඩු සහ අවුරුදු තිහ (30) ට නොවැඩි විය යුතු ය.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :
අ.පො.ස.(සා/පෙළ) විභාගයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයයන් 02 කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත් විය යුතු ය.

(*ඇ*) කායික සුදුසුකම් :
පිරිමි අයදුම්කරුවන් -
(i) උස - අවම උස අඩි පහ (05) යි අඟල් හතර (04) ක් විය යුතු ය.
(ii) පපුව - හුස්ම නාල්ලා පපුව අඟල් තිස්දෙක (32) ක් විය යුතු ය.

කාන්තා අයදුම්කරුවන් -
(i) උස - අවම උස අඩි පහ (05) යි අඟල් දෙක (02) ක් විය යුතු ය.

(*ඈ*) *වෙනත් සුදුසුකම්* :
(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුය.

(iii) චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා ඉහත (අ) සිට (ඈ) දක්වා වන සුදුසුකම් අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය වන විට සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය* :

අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමට පරීක්ෂණයක් පවත්වන අතර, මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

(i) මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44 (පිරිමි අයදුම්කරුවන් සඳහා)

(ii) කාන්තා අයදුම්කරුවන් සඳහා ද පරීක්ෂණයක් පැවැත්වේ.

යෝග්‍යතා පරීක්ෂණයෙන් *හෙවත්* ඔරොත්තුදීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බන්ධනාගාර නියාමක තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

| *අනු. අංකය* | *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | 25 |
| 02 | වෘත්තීය සුදුසුකම් | 15 |
| 03 | ක්‍රීඩා කෞෂල්‍යය | 30 |
| 04 | නායකත්වය හා ප්‍රජා සේවාවන් | 25 |
| 05 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 |
| | එකතුව | 100 |

08. *ව්‍යාජ තොරතුරු සැපයීම* :

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සාවද්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් පරීක්ෂණයට පෙර හෝ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක පත්වීම් බලධරයා විසින් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පුළුවන.

09. *පත්වීමේ කොන්දේසි* :

මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(*අ*) පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වනු ඇත.

(*ආ*) පත්වීම ලැබ වසර 03 ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය.

(*ඇ*) රාජ්‍ය සේවයෙහි පත්වීම පාලනය කරනු ලබන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST-02-01-18/02/2014 හා 2014.11.20 හා දිනැති ලිපියෙන් බන්ධනාගාර නියාමක තනතුර සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටියෙහි විධිවිධානයන් හා ඊට කරන ලද හා මින් මතු කිරීමට නියමිත සංශෝධනයන්ට යටත්ව බන්ධනාගාර නියාමක තනතුරට පත්වීම් ලබා දෙනු ලැබේ.

(*ඈ*) බන්ධනාගාර නියාමක තනතුරට පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම බන්ධනාගාර ආයතනයක සේවයෙහි යෙදීමට බැඳී සිටින අතර, ආරම්භක පුහුණු කාලය තුළ හෝ පසු ඉන් වසර 10 ක අනිවාර්ය සේවා කාලය ඉක්මවීමට මත්තෙන් පුහුණුව හෝ තනතුර අතහැර යන්නන් පුහුණුවට අදාළ සියළු වියදම් දෙපාර්තමේන්තුවට ගෙවීමට බැඳී සිටී.

(*ඉ*) බන්ධනාගාර නියාමක තනතුරට පත්වීම් ලබන්නන් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන තනිකඩ නිල නිවාසවල අවම වශයෙන් වසර 05 ක් නතර වී සේවය කළ යුතුය.

11. තෝරා ගැනීමේ පරිපාටිය :

(*අ*) ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බන්ධනාගාර නියාමක තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

12. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය විසින් 2014.01.21 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව, සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

13. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

13.1 ඉල්ලුම්පත සැකසීම

13.1.1 මෙම නිවේදනයට අමුණා ඇති ඉල්ලුම්පත් ආකෘතිය අනුව ඉල්ලුම්පත සැකසිය යුතුය. එසේ නොවුණ හොත් අයදුම්පත ප්‍රතික්ෂේප වේ.

13.1.2 සාමාන්‍ය ඡායා පිටපත් (21 x 29 cm / 8.5" x 12"/A4) කඩදාසියෙහි දෙපැත්තම භාවිතා කරමින් අයදුම්පත සකස් කළ යුතු ය.

13.2 ඉල්ලුම්පත සම්පූර්ණ කිරීම.

13.2.1 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයැදුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරීවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු.240,360.00 ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය. රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

13.2.2 නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන, අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

13.3 ඉල්ලුම්පත යොමු කිරීම

13.3.1 අයදුම්පත්‍රය බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීමේ පරීක්ෂණය - 2016" යන්න සඳහන් කළ යුතුය. අයදුම්පත සමඟ ඔබගේ ලිපිනය ලියූ රු.35.00 වටිනා මුද්දර ඇලවූ 9"x4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය.

13.3.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016.09.05 දින හෝ ඊට පෙර ලැබෙන සේ, ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයට පෙනී සිටීමට පහසු බන්ධනාගාරයේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. බන්ධනාගාර අයතනයන්හි ලිපිනයන් ලැයිස්තුව සඳහා 1 උපලේඛනය බලන්න.

13.3.3 තැපැල් කිරීමේ දී නැතිවීම හෝ 2016.09.05 දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිබඳව කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළු අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු නීතිරීති සහ මෙම නිවේදනයේ අඩංගු කොන්දේසි අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

*සටහන* :- පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

2016 ජූලි මස,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150,
බේස්ලයින් පාර,
කොළඹ 09.

(කාර්යයාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම - 2016***
***විවෘත අංශය***

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා (GUNAWARDHANA M. G. B. S. K. )
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (අ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(ආ) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ඇ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය සහ දිස්ත්‍රික්කය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

ස්ත්‍රී - 1, පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. විවාහක / අවිවාහක බව :

අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

06. උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

07. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස (2016.09.05) :-

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. පුරවැසිභාවය (පරම්පරාවෙන් ද / ලියාපදිංචි කිරීමෙන්ද යන වග) :————.

09. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

10. ශාරීරික මිනුම් :
උස : අඩි : ................ අඟල් : .............
පපුව : අඟල් : .........
(කාන්තා අයදුම්කරුවන් උස පමණක් ඇතුළත් කළ යුතුය)

11. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස.(සා.පෙළ) - පළමු වර

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :————.

අ.පො.ස.(සා.පෙළ) - දෙවන වර

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

12. වෙනත් සුදුසුකම් :————.

13. කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියේ වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ සියලුම විස්තර :————.

14. අයදුම්කරුගේ සහතිකය ：

15.

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ නිවැරදි ලෙස සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

(iii) අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සියලු කරුණු ඉතා හොඳින් කියවා අවබෝධ කරගත් බවත්, එහි සඳහන් සියළු කරුණු හා කොන්දේසි වලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ：

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන.................................................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු / ඇය මා ඉදිරිපිට දී ........................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

17. දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

............................................ මයා./මිය./මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුතු බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, මෙම තනතුරට අදාළ නිවේදනයේ පරිදි මෙම තනතුරට අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති බව ද, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.
(අදාළ නොවන වචන කපා හරින්න)

__________,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
දිනය :—————.
(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

උපලේඛනය 1

| *අනු. අංකය* | *දිස්ත්‍රික්කය* | *බන්ධනාගාර ආයතනය* | *බන්ධනාගාර ආයතනයෙහි ලිපිනය* |
|---|---|---|---|
| 01 | කොළඹ | බන්ධනාගාර පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය - බේස්ලයින් පාර, කොළඹ 09 | සහකාර බන්ධනාගාර අධිකාරී, පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය බේස්ලයින් පාර, කොළඹ 09. |
| 02 | ගම්පහ | මහර බන්ධනාගාරය | බන්ධනාගාර අධිකාරී, මහර බන්ධනාගාරය, රාගම. |
| 03 | කළුතර | කළුතර බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරී, කළුතර බන්ධනාගාරය, කළුතර. |
| 04 | මාතලේ | පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුර | බන්ධනාගාර අධිකාරී, පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුර, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ. |
| 05 | මහනුවර | බෝගම්බර බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරී, බෝගම්බර බන්ධනාගාරය, දුම්බර, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ. |
| 06 | නුවරඑළිය | තල්දෙන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය | සහකාර බන්ධනාගාර අධිකාරී, තල්දෙන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය, තල්දෙන. |
| 07 | ගාල්ල | ගාල්ල බන්ධනාගාරය | බන්ධනාගාර අධිකාරී, ගාල්ල බන්ධනාගාරය, ගාල්ල. |
| 08 | මාතර | මාතර බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරී, මාතර බන්ධනාගාරය, මාතර. |
| 09 | හම්බන්තොට | තංගල්ල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරී, තංගල්ල බන්ධනාගාරය, තංගල්ල. |
| 10 | යාපනය | යාපනය රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරී, යාපනය රිමාන්ඩ් බන්ධනාගාරය, යාපනය. |

| *අනු. අංකය* | *දිස්ත්‍රික්කය* | *බන්ධනාගාර ආයතනය* | *බන්ධනාගාර ආයතනයෙහි ලිපිනය* |
|---|---|---|---|
| 11 | මුලතිව් | වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය, වවුනියාව. |
| 12 | කිළිනොච්චිය | වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය, වවුනියාව. |
| 13 | වවුනියාව | වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය, වවුනියාව. |
| 14 | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | සහකාර බන්ධනාගාර අධිකාරි, ත්‍රිකුණාමලය රිමාන්ඩ් බන්ධනාගාරය, ත්‍රිකුණාමලය. |
| 15 | මඩකලපුව | මඩකලපුව බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, මඩකලපුව බන්ධනාගාරය, මඩකලපුව. |
| 16 | අම්පාර | මොණරාගල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, මොණරාගල බන්ධනාගාරය, මොණරාගල. |
| 17 | පුත්තලම | මීගමුව බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, මීගමුව බන්ධනාගාරය, මීගමුව. |
| 18 | කුරුණෑගල | වාරියපොල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, වාරියපොල බන්ධනාගාරය, වාරියපොල. |
| 19 | අනුරාධපුරය | අනුරාධපුර බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, අනුරාධපුරය බන්ධනාගාරය, අනුරාධපුරය. |
| 20 | පොළොන්නරුව | පොළොන්නරුව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, පොළොන්නරුව රිමාන්ඩ් බන්ධනාගාරය, පොළොන්නරුව. |
| 21 | බදුල්ල | බදුල්ල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, බදුල්ල බන්ධනාගාරය, බදුල්ල. |
| 22 | මොණරාගල | මොණරාගල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, මොණරාගල බන්ධනාගාරය, මොණරාගල. |
| 23 | කෑගල්ල | කෑගල්ල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, කෑගල්ල රිමාන්ඩ් බන්ධනාගාරය, කෑගල්ල. |
| 24 | රත්නපුරය | කුරුවිට බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, කුරුවිට බන්ධනාගාරය, කුරුවිට. |
| 25 | මන්නාරම | වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි, වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය, වවුනියාව. |

08-224

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ III ශ්‍රේණියේ උපවැඩ පරීක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016

මෙම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ III ශ්‍රේණියේ උපවැඩ පරීක්ෂක තනතුරෙහි පවතින පුරප්පාඩු දහය(10) සඳහා සුදුසුස්සන් තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ" වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙලවරේ "බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ උපවැඩ පරීක්ෂක තනතුර සඳහා බඳවා ගැනීම - 2016" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. මෙම විභාගය 2016 ඔක්තෝබර් මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

■ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2016 සැප්තැම්බර් මස 05 වැනි දින වේ.

*සටහන* : අයදුම් පත්‍රයක් හෝ ඊ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතු ය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) ලිඛිත තරග විභාගයේ කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් පරීක්ෂා කර පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් වන අතර, එහි දී ලකුණු ලබාදීමක් සිදු නොකර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

(ii) ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙක(02)කින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාග විෂයය සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු හා කාලය පහත දැක්වේ.

| *අනු. අංකය* | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | තාක්ෂණික දැනුම | පැය 03 | 100 | 40% |

*බුද්ධි පරීක්ෂණය.-* අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 50කින් යුක්තවන අතර ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

*තාක්ෂණික දැනුම.-* ගොඩනැගිලි ඉදිකිරීම් මූලධර්ම, ඉදිකිරීම කාර්ය සඳහා පිඹුරුපත් සැකසීමේ හැකියාව වටහා ගැනීම, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව දැනුම. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුන(03)ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන(03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2014 ප්‍රකාරව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවයක් ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 06/2016 දරණ වැටුප් චක්‍රලේඛයට අනුව MT - 1 - 2016 වැටුප් කේත අංකය යටතේ රු.29,840 - 10x300 - 11x350 - 10x560 - 10x660 - 48,890ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)

4. සුදුසුකම් :

4.1 අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හය(06)කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

4.2 කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

4.3 වෘත්තීය සුදුසුකම් :
අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතා (NVQ 05) 05 වන මට්ටමේ හෝ ඒ හා සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

4.4 වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්කරු මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත විය යුතු ය.

(iii) චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දින වන 2016.09.05 දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. වයස් සීමාව :
අවම වයස අවුරුදු 18ත්, උපරිම වයස අවුරුදු 35ත් අතර වේ. ඒ අනුව වයස සම්බන්ධ සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1998.09.05 දින හෝ ඊට පෙර හා 1981.09.05 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.

6. අයදුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

7. ඉල්ලුම් කිරීමේ පිළිවෙල:

(i) අයදුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආකෘතියට අනුකූල විය යුතුය. එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 3.27" x 11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් සිය අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද හෝ යතුරු ලියනය කරන ලද හෝ අයදුම්පත් ද භාවිතා කළ හැකිය. ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවට ද, 06 සිට 11තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම් පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත). තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයට නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. අයදුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ ඕනෑම තැපැල්/ උපතැපැල් කාර්යාලයකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 750ක මුදලක් ගෙවා ලබාගත් ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබාගැනීම ඉතාම යෝග්‍යය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

8.

(i) මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියළුම අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙසේ ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරුවෙකු විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් 011 -2784232 දරන ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) මෙම නිවේදනයේ 01 ඡේදයට අනුව විභාගයට පෙනී සිට එක් එක් විෂයයට ලකුණු 40%කට නොඅඩුව ලබාගන්නා අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

(iv) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9. *අනන්‍යතාවය* :

අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන් ලද වලංගු ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බල පත්‍රය;
ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම බලය ලත් කෙනෙකු විසින් කළ යුතුය. එනම්, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු.240,360 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ආයතන ප්‍රධානියා විසින් ද සහතික කළ යුතුය.

11. මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,

2016 ජූලි 26 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානයේ දීය.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ III ශ්‍රේණියේ උපවැඩ පරීක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016
(Open Competitive Examination
for Recruitment to the Post of Sub Work Inspector Grade III of
Management Assistant Technical Segment in the Department of Prisons - 2016.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර ඃ

3.1 හැඳුනුම්පත් අංකය ඃ ☐☐☐☐☐☐☐☐☐☐

3.2 නිකුත් කළ දිනය ඃ ☐

04. ස්ත්‍රී /පුරුෂභාවය ඃ

පුරුෂ - 0 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

ස්ත්‍රී - 1

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ ඃ

පරම්පරාවෙන් -1 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

ලියාපදිංචියෙන් -2

06. ජනවර්ගය ඃ

සිංහල 1
ලංකා දෙමළ 2 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
ඉන්දියානු දෙමළ 3
මුස්ලිම් 4
බර්ගර් 5
වෙනත් 6

07. දුරකථන අංකය :————.

08. උපන් දිනය ඃ

(අ) අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

09. ඔබ කවදා හෝ උසාවියකින් වරදකරුවෙකු වී තිබේ ද? ඔව්/ නැත.

"ඔව්" නම් විස්තර සඳහන් කරන්න. :————.

10. අධ්‍යාපන සුදුසුකම් ඃ

| *අධ්‍යාපනය ලබා ඇති පාසල/ පිරිවෙන* | *අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *විෂයයන්* | *ලබා ඇති සාමාර්ථයන්* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. වෘත්තීය සුදුසුකම් :

| *ජාතික වෘත්තීය කුසලතා මට්ටම* | *එම විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *ජාතික වෘත්තීය කුසලතා ලබාගත් ආයතනය* |
|---|---|---|
| | | |
| | | |

12. විභාග ගාස්තුව :
   (i) ගෙවන ලද තැපැල් කාර්යාලය :————.
   (ii) ගෙවූ මුදල :————.
   (iii) ගෙවූ දිනය :————.
   (iv) ලදුපතේ අංකය :————.

ලදුපත එහි එක් දරයක් මගින් මෙහි අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ලග තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

13. අයදුම්කරුගේ ප්‍රකාශය/ සහතිකය :

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තවද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................................................................................... මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ................................................ මස ............ වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
සහතික කරන්නාගේ තනතුර :————.
සහතික කරන්නාගේ ලිපිනය :————.

නිල මුද්‍රාව :

දිනය :————.

15. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/ පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .......................................................... මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .......................................... ලෙස සේවය කරන අතර, ඔහුගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

08-225

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 2017 අධ්‍යයන වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම

2017 අධ්‍යයන වර්ෂය තුළ දී පැවැත්වෙන එක් අවුරුදු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර ) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම පාඨමාලාව කොළඹ, පේරාදෙණිය සහ යාපනය යන විශ්ව විද්‍යාලවල පැවැත්වේ.

03. එක් එක් විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යයන් පහත දක්වා ඇති අතර පාඨමාලාව සඳහා එක් භාෂා මාධ්‍යයකින් පමණක් අයදුම් කළ හැකිය.

1. කොළඹ විශ්ව විද්‍යාලය - සිංහල සහ දෙමළ මාධ්‍යය
2. පේරාදෙණිය විශ්ව විද්‍යාලය - සිංහල මාධ්‍යය
3. යාපනය විශ්ව විද්‍යාලය - දෙමළ මාධ්‍යය

04. සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු / ඇය පහත සඳහන් සුදුසුකම් ඇත්තෙකු බව තහවුරු කළ යුතුය.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියෙකු වීම.
(ii) 2016.09.02 දිනට වයස අවුරුදු 50ට නොවැඩි වීම.
(iii) මනා කායික හා මානසික සෞඛ්‍යයකින් සහ යහපත් චරිතයකින් යුක්ත වීම.
(iv) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත වෙනත් ආයතනයකින් උපාධියක් හෝ ඒ හා සමාන මට්ටමේ ලා සැලකෙන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.
(v) පහත දැක්වෙන සේවාවලට අදාළ තනතුරක ස්ථිර පත්වීමක් ලැබ සේවය කිරීම.

(අ) * ශ්‍රී ලංකා පරිවේනාචාර්ය සේවය
* ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවය
* ශ්‍රී ලංකා ගුරු සේවය
(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවය
(ඇ) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය
(ඉ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

(vi) 2016.09.02 වැනි දිනට අංක 04 (v) හි දක්වා ඇති සේවාවකට අයත් තනතුරක උපාධිධාරියකු ලෙස අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සැලකිය යුතුයි* :-

1. ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පත්වීම් ලබා ඇති ගුරුවරුන් 2016.09.02 වැනි දිනට තම පත්වීමට අදාළ බැඳුම්කරයේ කාලසීමාව වන අනිවාර්යය පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණ වී තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.
2. අධ්‍යයන නිවාඩු ලබා බැඳුම්කරයකට යටත්ව සිටින අයදුම්කරුවන් 2016.09.02 වැනි දිනට බැඳුම්කරයේ සඳහන් අනිවාර්යය සේවා කාලය අවසන් කළ හෝ එසේ නොමැති නම් ඉන් අවුරුදු පහක්වත් (05) සම්පූර්ණ කර තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබති.
3. අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළ නොහැකිය.

05.

05.1 තෝරා ගැනීමේ පිළිවෙල :

(i) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

(ii) පාඨමාලාව සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණු අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(iii) *ගැසට් නිවේදනයේ* අංක 04(v) හි අයදුම්කරු අයත් වන සේවාවට/සේවාවලට අදාළ තනතුරෙහි/තනතුරුවල සේවා කාලය සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනැමීම සිදු කෙරෙනු ඇත.සේවා කාලයේ එක් අවුරුද්දකට ලකුණු 04 බැගින් පිරිනැමේ.සේවා කාලය සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය 40කි. අයදුම්කරුවකුගේ සේවා කාලය ගණනය කරන්නේ ඔහු / ඇය 4 (v) හි දැක්වෙන සේවාවන් අතුරින් මුලින්ම පත්වීම ලද සේවයේ අදාළ තනතුරෙහි වැඩ භාරගත් දින සිටය.

*සැ.යු.-*
04. (v)හි සඳහන් සේවාවක / සේවාවල තනතුරක / තනතුරුවල අඛණ්ඩ සේවා කාලයක් පැවතිය යුතුය.

(iv) ලිඛිත පරීක්ෂණයේ ලකුණු හා සේවා කාලය සඳහා ලැබෙන ලකුණුවල එකතුව අවසාන ලකුණ සේ සලකා එම ලකුණු අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා තෝරා ගැනීම සිදු කෙරෙනු ඇත.

(v) දුබලතා සහිත අයදුම්කරුවන් අයදුම් කළහොත් පාඨමාලාවට තෝරාගනු ලබන සංඛ්‍යාවෙන් 1%ක් ඔවුන් සඳහා වෙන් කරනු ලැබේ.
(vi) පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලබන සංඛ්‍යාව එක් එක් විශ්ව විද්‍යාලයේ තිබෙන ඉඩකඩ ප්‍රමාණය අනුව තීරණය වනු ඇත.

05. 2. ලිඛිත පරීක්ෂණය :

(i) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය සිංහල හා දෙමළ

යන භාෂා මාධ්‍ය දෙකෙන් කොළඹ හා යාපනය යන නගරවලදී පැවැත්වේ.

(ii) ඉහත සඳහන් මධ්‍යස්ථාන දෙක අතරින් තමා ඉල්ලුම් කළ මධ්‍යස්ථානයේදී ඉල්ලුම් කළ මාධ්‍යයෙන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය හැකිය. අයදුම්කරන ලද විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කරනු නොලැබේ.

(iii) විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම පිළිබඳව ප්‍රකාශ කොට ඇති නීතිරීතිවලට අනුකූලව විභාග අපේක්ෂකයන් විසින් කටයුතු කළ යුතුය.

(iv) ලිඛිත පරීක්‍ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය.
- (*අ*) සාමාන්‍ය දැනීම :
  කාලීන තොරතුරු , සාමාන්‍ය දැනීම, අධ්‍යාපනික තොරතුරු හා ගැටලු පිළිබඳ ප්‍රශ්න පත්‍රය
  (කාලය පැය 01)
- (*ආ*) අභියෝග්‍යතාවය :
  භාෂා හැකියාව , අවබෝධය,තර්කනය හා සංඛ්‍යානමය කුසලතා පිළිබඳ ප්‍රශ්න පත්‍රය
  (කාලය පැය 01 මිනිත්තු 30 යි)

05. 03. සම්මුඛ පරීක්ෂණය :

(i) සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් *ගැසට් නිවේදනයේ* 04 වැනි ඡේදය අනුව තමන් පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බව තහවුරු කළ යුතුය.

(ii) අපේක්ෂකයින් විසින් *ගැසට් නිවේදනයේ* අංක 04 (v) හි අදාළ තනතුරෙහි / තනතුරුවල සේවා කාලය තහවුරු කිරීමට නියමිත ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.විශේෂයෙන්ම මුල් පත්වීමට අදාළ තනතුරෙහි වැඩ භාරගත් දිනය සම්මුඛ පරීක්ෂණයේදී තහවුරු කළ යුතුය.එය අපේක්ෂකයාට සේවා කාලය සඳහා නියමිත ලකුණු ලබා ගැනීමට උපකාර වනු ඇත.

(iii) රජයේ ලියාපදිංචි පිරිවෙන් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන ගුරුභවතුන්,
- (අ) පාඨමාලාව සඳහා නිදහස් කරන බවටත්,
- (ආ) පාඨමාලාව හදාරන කාලය තුළ වැටුප් ගෙවන බවටත්,
- (ඇ) පාඨමාලාව අවසානයේ ගුරුභවතා නැවත සේවයට යොදාගන්නා බවටත්,
- (ඈ) අදාළ ගුරුභවතාගේ අධ්‍යයන කාලය තුළ ඔහු / ඇය ගේ පුරප්පාඩුවට වෙනත් ගුරුවරයෙකු බඳවා නොගන්නා බවටත්,
- (ඉ) ගුරුභවතාගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවටත්, ආයතනයේ කෘත්‍යාධිකාරී/පාලක මණ්ඩල කළමනාකරු විසින් සහතික කරන ලද ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

06. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

(i) දී ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපස භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කළ යුතුය.

(ii) දෘශ්‍යාබාධිත / ශ්‍රව්‍යාබාධිත / වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන අයදුම්පත්වල වම්පස උඩ කෙළවරේ රතුපාටින් "දෘශ්‍යාබාධිත / ශ්‍රව්‍යාබාධිත / වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි." යනුවෙන් සඳහන් කළ යුතුය.

(iii) *විභාග ගාස්තු ගෙවීම*.- විභාග ගාස්තු වශයෙන් රු.750ක මුදලක් ළඟම ඇති තැපැල් කාර්යාලයට ගෙවා ලබා ගත් කුවිතාන්සිය අයදුම්පතෙහි ඒ සඳහා ඇති කොටුවෙහි ඇලවිය යුතුය.

2016.08.05 දින සිට 2016.09.02 දින දක්වා සියලුම තැපැල් කාර්යාලයන්හි මෙම කුවිතාන්සිය නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදන ලෙස විභාග දෙපාර්තමේන්තුව විසින් තැපැල්පති වෙත දන්වා යවනු ඇත.

(iv) අයදුම්පත් එවීම :
- (*අ*) අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ " පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව -2017 " යනුවෙන් සඳහන් කළ යුතුය.
- (*ආ*) 2016.09.02 දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල් , ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවිය යුතු වේ.
- (ඇ) ඉදිරිපත් කරන අයදුම්පතෙහි පිටපතක් අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට ආයතන ප්‍රධානියා මඟින් භාරදිය යුතු වේ. එය පාඨමාලාව සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහුට / ඇයට අධ්‍යයන නිවාඩු ලබාගැනීමේ දී උපකාරී වනු ඇත.

(v) කාලසටහන් හා ප්‍රවේශපත්‍ර විභාග අපේක්ෂකයින් වෙත තැපැල් මඟින් නිකුත් කරන අතර තම ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 07 කට පෙර නොලැබුනහොත් "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට පහත සඳහන් තොරතුරු සහිතව දැන්විය යුතු වේ.
- (*අ*) විභාගයේ නම :————.
- (*ආ*) විභාග අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :———.
- (*ඇ*) ලිපිනය :————.

(ඈ) මුදල් ගෙවන ලද තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :————.

(ඉ) ඉල්ලුම්පත තැපැල් කළ දිනය :————.

(ඊ) ඉල්ලුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :————.

(vi) කිසිදු හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු භාරදීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම කරනු නොලැබේ.

(vii) අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(viii) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව, වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් මඟින් තහවුරු කළ යුතු ය.

(ix) අදාළ පාඨමාලාව හැදෑරීමට අයදුම්කරුවකු යම් විශ්වවිද්‍යාලයකට තෝරාගැනීමෙන් පසු විශ්වවිද්‍යාලය මාරුකිරීමට අවසර දෙනු නොලැබේ.

(x) තෝරා ගැනීමෙන් පසුව වුව ද *ගැසට් නිවේදනයට* අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව පෙනී යන්නේ නම් එවැනි අපේක්ෂකයකුගේ තෝරා ගැනීම අවලංගු කිරීමට සිදුවේ.

07. *අධ්‍යයන නිවාඩු* :

තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සහ ජාතික පාසල්, පෞද්ගලික පාසල් සහ පිරිවෙන්වල සේවයේ නියුක්ත විදුහල්පති ශ්‍රේණිධාරීන් සහ ගුරුවරුන් අධ්‍යයන නිවාඩු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ද, සෙසු අයදුම්කරුවන් අධ්‍යයන නිවාඩු අදාළ පළාතේ අධ්‍යාපන ලේකම් වෙතින් ද අනුමත කරගත යුතු වේ.

08. *බැඳුම්කරය* :

පාඨමාලාවට තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නීති රීති අනුව නියමිත කාල පරිච්ඡේදයක් ඔහු/ඇය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට අධ්‍යාපන ලේකම්/පළාත් අධ්‍යාපන ලේකම් සමඟ ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතුවේ.

09. තෝරාගනු ලැබූ අයදුම්කරුවකු පාලනය කර ගත හැකි හේතූන් මත පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ නොකර නියමිත කාලසීමාව ඇතුළත දී ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට අපොහොසත් වූයේ නම්, එම අධ්‍යයන නිවාඩු කාලය තුළ ඔහුට/ ඇයට ගෙවන ලද සම්පූර්ණ වැටුප් හා දීමනා ආපසු ගෙවිය යුතු වේ.

10. පාඨමාලාව හදාරන කාලය තුළ දී ශිෂ්‍යයින්ගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක බව පෙනී ගියහොත් ඔවුන් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

11. මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2016 අගෝස්තු මස 05 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

***2017 වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කිරීම***

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| *ඉල්ලුම් කරන මාධ්‍යය (සිංහල/දෙමළ)* | *ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය (කොළඹ/යාපනය)* | *ඉල්ලුම් කරන විශ්වවිද්‍යාල (කොළඹ/යාපනය/පේරාදෙණිය) සැ. යු. මනාපය අනුපිළිවෙළින් විශ්වවිද්‍යාල දෙකක් සඳහන් කරන්න.* |
|---|---|---|
| | | 1.<br>2. |

01. (i) මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (වාසගම ඉදිරියෙන්) :————.
*උදා :* Mr. SILVA A. B. C.
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) (*අ*) රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*ආ*)රාජකාරි දුරකථන අංකය :————.

(ii) (*අ*) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*ආ*) පෞද්ගලික දුරකථන අංකය :————.
(iii) සේවය කරන පාසලේ/ආයතනයේ පිහිටීම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

| පළාත | දිස්ත්‍රික්ක | කලාපය |
|---|---|---|
| | | |

(iv) ආයතනයේ ස්වභාවය (රජයේ පාසල්/පෞද්ගලික පාසල්/පිරිවෙන්/වෙනත්) :————.

03. (i) උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

(ii) 2016 09.02 වැනි දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

(iii) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

04. *උපාධිය පිළිබඳ විස්තර :*

| *උපාධිය* | *විශ්ව විද්‍යාලයේ පාඨමාලාව හැදෑරූ කාලය ( ..........සිට ......... දක්වා)* | *උපාධිය සමත් වූ වසර* | *උපාධිය වලංගු දිනය* | *උපාධි විෂයයන්* | *සාමාර්ථයේ ස්වභාවය* | *විශ්ව විශ්ව විද්‍යාලය/ ආයතනය* | *උපාධිය (අභ්‍යන්තර/බාහිර)* |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

05. (i) (*අ*) ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයට/ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයට/ශ්‍රී ලංකා ගුරු සේවයට පත් වූ දිනය :————.
(*ආ*) එම සේවයේ වැඩ භාරගත් දිනය :————.
(*ඇ*) දැනට දරන තනතුර :————.

(ii) (*අ*) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ දිනය :————.

(*ආ*) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වැඩ භාරගත් දිනය :————.

(iii) උපාධියෙන් පසු 2016.09.02 වැනි දිනට 4 V හි සඳහන් අදාළ සේවයේ/සේවාවල සේවා කාලය :————.

(iv) 2016.09.02 වැනි දිනට 4 V හි සඳහන් අදළ සේවයේ/සේවාවල සම්පූර්ණ සේවා කාලය :————.

06. වෘත්තීය පුහුණු පිළිබඳ විස්තර :

| පාඨමාලාව හැදෑරූ ආයතනය (ගුරු විද්‍යාලය/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හෝ වෙනත් | පාඨමාලාව (විෂය ක්ෂේත්‍රය) | ආයතනයේ පාඨමාලාව හැදෑරූ කාලසීමාව | |
|---|---|---|---|
| | | දින සිට | දින දක්වා |
| | | | |

07. ලබාගත් අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර :

| අධ්‍යයන නිවාඩුවේ ස්වභාවය (වැටුප් සහිත/ වැටුප් රහිත, දේශීය/විදේශීය) | අධ්‍යයන නිවාඩු ලබාගත් කාරණය | කවර කාලසීමාවේ ද යන්න | බැඳුම්කර කාලය (.............දින සිට ............. දින දක්වා) | බැඳුම්කර කාලය සම්පූර්ණ කර ඇති ද/ නැති ද යන වග (සම්පූර්ණ නැතිනම් ඒ සඳහා ඉදිරියට ඇති කාලය සඳහන් කරන්න) |
|---|---|---|---|---|
| | | | | |

*සැ. යු.*-මීට පෙර ලබා ඇති අධ්‍යයන නිවාඩුවලට අදාළව උක්ත වගුව නිවැරදිව සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

*සටහන.*- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ කාලසීමාව අධ්‍යයන නිවාඩුවක් ලෙස නොසැලකේ.

08. (*අ*) ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පවතී ද? ඔව්/නැත
(*ආ*) පවතී නම් ඒ සම්බන්ධ තොරතුරු ? :—————.

| 09. | තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවන්න. | කුවිතාන්සි අංකය :<br>දිනය :—————.<br>—————. තැපැල්/උප තැපැල් කාර්යාලයට<br>රු. :—————. (මුදල අකුරෙන්) ගෙවන ලද බවට සහතික කරමි.<br>අයදුම්කරුගේ අත්සන :—————.<br>දිනය :—————. |
|---|---|---|

10. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි හා සත්‍ය බවට ද, 2016.08.05 වැනි දින *ගැසට් නිවේදනයේ* 04 වැනි ඡේදය අනුව මා මෙම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බවට ද, විභාග පනතේ අයදුම්කරුවන් සඳහා වූ නීතිරීති වලට එකඟව කටයුතු කරන බවට ද නියමිත විභාග ගාස්තු ගෙවා වලංගු කුවිතාන්සියක් අමුණා ඇති බවට ද මෙයින් සහතික වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

11. *පාඨමාලාව සඳහා ආයතනයෙන් නිදහස් කිරීමේ නිර්දේශය :*

(විදුහල්පති, පීඨාධිපති, කෘත්‍යාධිකාරී, පාලක මණ්ඩලයේ කළමණාකරු හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.)

පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමේ අවශ්‍යතාවය සලකා බලා මෙම අයදුම්කරු සේවයෙන් නිදහස් කරමි/නොකරමි.

————,
විදුහල්පතිගේ/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

12. පාඨමාලාව සඳහා අයදුම්කරුවන් නිදහස් කිරීම පිළිබඳ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ නිර්දේශය :

උක්ත නම සඳහන් අයදුම්කරු පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි./නිර්දේශ නොකරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
(අත්සන හා නිල මුද්‍රාව.)

දිනය :————.

08-192

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **අගෝස්තු** | 2016.08.05 | සිකුරාදා | 2016.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.12 | සිකුරාදා | 2016.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.19 | සිකුරාදා | 2016.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.26 | සිකුරාදා | 2016.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2016.09.02 | සිකුරාදා | 2016.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.09 | සිකුරාදා | 2016.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.15 | බ්‍රහස්පතින්දා | 2016.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.23 | සිකුරාදා | 2016.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.30 | සිකුරාදා | 2016.09.15 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2016.10.07 | සිකුරාදා | 2016.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.14 | සිකුරාදා | 2016.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.21 | සිකුරාදා | 2016.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.28 | සිකුරාදා | 2016.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.